කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2016

2022 දෙසැම්බර් - 2023 මාර්තු

සමාජීය විද්‍යා පීඨය

සමාජ විද්‍යාව (නව/පැරණි නිර්දේශය)

**සංස්කෘතිය හා සංවර්ධනය SOCI – E 2025**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

01. සංස්කෘතිය යනු කුමක්දැයි නිර්වචනය කර සංස්කෘතියේ සංරචක මොනවාදැයි විග්‍රහ කරන්න.

02. "සංවර්ධනය යනු හුදෙක් ආර්ථික වෘද්ධියක් පමණක්ම නොවේ." 1990 න් පසු සංවර්ධනය පිළිබඳ ගොඩනැගී ඇති අදහස් සලකා බලමින් මේ ප්‍රකාශය පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

03. යුරෝපයේ ධනවාදයේ සංවර්ධනය පිළිබඳ වෙබේරියානු දෘෂ්ටිය කෙරෙහි අවධානය යොමු කරමින් දකුණු ආසියානු රටවල සංවර්ධනයට බාධාකාරී වන සමාජ සංස්කෘතික සාධක මොනවාදැයි විශ්ලේෂණය කරන්න.

04. නිදහසින් පසු ශ්‍රී ලංකාව අනුගමනය කළ සංවර්ධන ආකෘතිය රටේ වත්මන් ආර්ථික, දේශපාලන සහ සමාජීය ව්‍යාකූලත්වයට බලපා ඇත්තේ කෙසේදැයි විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න.

05. "අසංවිධානාත්මක නාගරීකරණය සංවර්ධනය වෙමින් පවතින රටවල් මුහුණ දෙන බලවත් ගැටලුවකි." මේ ප්‍රකාශය පිළිබඳ ඔබේ අදහස් දක්වන්න.

06. ස්වකීය කාර්යභාරයේ වෙනස්වීම නිසා නූතන දකුණු ආසියානු කාන්තාවන් මුහුණ දෙන ගැටලු පිළිබඳ විග්‍රහයක් කරන්න.

07. ජනවාර්ගිකත්වය සහ ආගම ආසියාවේ දියුණු වෙමින් පවතින රටවල සමාජ ගැටුම්වලට දායක වී ඇති ආකාරය නිදසුන් සහිතව සාකච්ඡා කරන්න.

08. පහත සඳහන් මාතෘකා අතරින් දෙකකට (02) සටහන් ලියන්න.

    i. ප්‍රතිමාන (Norms)
    ii. සංස්කෘතික තිගැස්ම (Cultural shock)
    iii. කුලය සහ සමාජ ධූරාවලිය
    iv. ඊ. බී. ටයිලර් (E.B. Tylor)

*******************************